
# 15 ධර්මපාලතුමාගේ ජාතික ශාසනික මෙහෙය අගයමු

ශතවර්ෂ තුනක විදේශීය පාලනය හේතු කොට ගෙන ජාතික ආගමික නිදහස ඇහිරී සෑම අතින් ම පරාධීන ව සිටි ශ්‍රී ලාංකික සිංහල බෞද්ධ ජනතාව තුළ ජාතික හා ශාසනික හැඟීම් පුබුදුවා නව ජීවයක් ගෙන දීමට ක්‍රියා කළ ගිහි බෞද්ධ ශ්‍රාවකයන් අතර ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමන්ට ප්‍රමුඛස්ථානයක් හිමි වෙයි. එතුමාගේ දෙමාපියන් වූයේ කොළඹ කොටහේනේ පදිංචි ව සිටි මාතර හිත්තැටියේ **දොන් කරෝලිස් හේවාවිතාරණ** මුදලිතුමන් හා **මල්ලිකා හේවාවිතාරණ** ළමාතැනී ය. 1864 සැප්තැම්බර් 17 දින උපත ලද මෙම දරුවාට දෙමාපියන් විසින් තබන ලද නාමය වූයේ ඩේවිඩ් හේවාවිතාරණ යන්න යි. එකල රජයේ පාසල් හෝ බෞද්ධ පාසල් නො තිබුණු බැවින් ඩේවිඩ් හේවාවිතාරණ අධ්‍යාපනය ලැබූයේ මිෂනාරී ක්‍රිස්තියානි පාසල්වල ය.

දෙමටගොඩ **බැප්ටිස්ට්** පාසලෙන් ඉගෙනුම ආරම්භ කළ හෙතෙම කොටහේන **බෙනඩික්ට්** විද්‍යාලයයෙන් සහ කෝට්ටේ **ක්‍රිස්තු** විද්‍යාලයයෙන් ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබී ය. වැඩිදුර අධ්‍යාපනය ලැබූයේ ගල්කිස්සේ **ශාන්ත තෝමස්** විද්‍යාලයයෙනි. ඒ කල බුද්ධධර්මය පාසල් විෂය මාලාවට ඇතුළත් නොවී ය. ඒ බැවින් ආගම ලෙස ඉගෙනගත්තේ ක්‍රිස්තුධර්මය යි. එය ඉගෙනීම අනිවාර්ය විය. දෙගුරුන් නිසා කුඩා කල සිට ම සැදැහැතියකු ව සිටි ඩේවිඩ් හේවාවිතාරණ පන්සල ඇසුරෙන් බුදුදහම, පාලි හා සිංහල පිළිබඳ මනා දැනුමක් ලබා ගත්තේ ය. කොටහේනේ **දීපදුත්තාරාමයේ** එවකට වැඩ සිටි වාදීභසිංහ **මිගෙට්ටුවත්තේ ගුණානන්ද** ස්වාමීන් වහන්සේගේත් මාලිගාකන්දේ විද්‍යෝදය පරිවේණාධිපති **හික්කඩුවේ ශ්‍රී සුමංගල** නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේත් ඇසුර ලැබීමට **ඩේවිඩ් හේවාවිතාරණ** කුමරුවෝ අතිශය භාග්‍ය සම්පන්න වූහ.

අප රටේ බ්‍රිතාන්‍ය පාලන සමයෙහි වැඩි සැලකිලි ලැබුණේ ඉංග්‍රීසි උගත් ක්‍රිස්තු භක්තිකයන්ට පමණකි. සිංහල බෞද්ධයන් නො සලකා හැර තිබිණ. රජයේ රැකියා ලබා ගැනීම පිණිස ඉංග්‍රීසි ඉගෙන ක්‍රිස්තියානි ආගම වැළඳගත් ධනවත් සිංහලයෝ ද බටහිර ක්‍රමයට ම හැඩ ගැසුණහ. ඔවුහු සිංහල භාෂාව, බුදුදහම හා දේශීය සිරිත් විරිත් නොසලකා හැරියහ. යුරෝපීය ඇඳුම් පැළඳුම්, සිරිත් විරිත් අගය කළ ඇතැම් සිංහලයෝ තම මවුපියන් දායාද කළ ආර්ය සිංහල නම් අතහැර ඉංග්‍රීසි නම් තබා ගැනීමට ඉමහත් රුචිකත්වයක් දැක්වූහ. ඉංග්‍රීසි නො දනගත්තත් ඉංග්‍රීසියෙන් අත්සන් කිරීමට පුරුදු වූහ. එයින් පැහැදිලි වන්නේ ඉංග්‍රීසි පාලනය යටතේ නිවට නියාලු තත්වයට ඇතැම් සිංහලයන් පත් ව සිටි අයුරුයි.

මිගෙට්ටුවත්තේ ගුණානන්ද ස්වාමීන් වහන්සේගේ චතුර දේශනවලට සවන් දී පණ ගැන්වී සිටි ඩේවිඩ් හේවාවිතාරණ, සුදු පාලකයින්ගේ සහ මිෂනාරීන්ගේ බලයට හා අසාධාරණකම්වලට එරෙහි ව ක්‍රියා කොට අහිමිකර තිබුණු සිංහල බෞද්ධ අයිතිවාසිකම් යළි ලබා ගැනීමට අදිටන් කර ගත්තේ තරුණ කාලයේ දී ම ය. ඔහුගේ අදහස් ශක්තිමත් වීමට ප්‍රබල ලෙස බලපෑයේ සෙන්පති **හෙන්රි ස්ටීල් ඕල්කට්** තුමාගේ ඇසුර ලැබීම ය. ඕල්කට් තුමා බෞද්ධයන්ගේ නැති වී ගිය අයිතිවාසිකම් යළි ලබා ගැනීමෙහි ලා උනන්දු කරවීම පිණිස බුදුදහම සහ බෞද්ධ අධ්‍යාපනය පිළිබඳ දේශන රටපුරා පැවැත්වී ය. එතුමා ඉංග්‍රීසියෙන් කළ දේශන සිංහලට පරිවර්තනය කරනු ලැබූයේ ඩේවිඩ් හේවාවිතාරණ තරුණයා විසිනි.



අනගාරික ධර්මපාල තුමා


ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා තිබුණු බැවින් රජයේ ලිපිකරු රැකියාවක් ලද නමුත් එහි නිරත වීම ඉංග්‍රීසි පාලකයන්ට ගැතිකම් කිරීමක් ලෙස සැලකූ ඩේවිඩ් හේවාවිතාරණ එය අතහැර දමා ඕල්කට්තුමාගේ ආගමික හා සමාජසේවා කටයුතුවලට සහාය විය. සිංහල බෞද්ධ දරුවන් සඳහා පාසල් නොතිබුණු බැවින් පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවා එමඟින් බෞද්ධ පාසල් ආරම්භ කිරීමට පියවර ගනු ලැබූයේ ඕල්කට් තුමන් විසිනි. එම කටයුතු කාර්යක්ෂමව ඉදිරියට ගෙනයෑම සඳහා පූර්ණ කාලය යෙදවූ හේවාවිතාරණ තරුණයා පරම විඥානාර්ථ බෞද්ධ සමාගමේ සරසවි සඳරැස පත්‍රය වෙනුවෙන් ද කැප වී කටයුතු කළේ ය.

ආර්ය සිංහල සිරිත් විරිත් බෙහෙවින් අගය කළ මෙම තරුණයා 'ඩේවිඩ්' යන නාමය අතහැර 'ධර්මපාල' යන නම භාවිත කිරීමට පටන් ගත්තේ විදේශික නම් අත හැර ආර්ය සිංහල නම් යොදා ගැනීමට සිංහල බෞද්ධයන් තුළ පෙළඹවීමක් ඇති කරවමිනි.

විවාහ ජීවිතයට ඇතුළත් නොවී බ්‍රහ්මචාරී ව වෙසෙමින් සිංහල ජාතියේත් සම්බුද්ධ ශාසනයේත් අභිවෘද්ධිය පිණිස කටයුතු කිරීමට එතුමා තීරණය කළේ විසිඑක් හැවිරිදි තරුණයකු ව සිටිය දී ය. අනගාරික ධර්මපාල යන නමින් එතුමන් හැඳින්වෙන්නට වූයේ එ තැන් සිට ය.

චතුර කථිකයකු වූ අනගාරික ධර්මපාල තුමා ජාතික සහ බෞද්ධ හැඟීම් ජනතාව තුළ ඇති කරමින් දේශන පැවැත්වී ය. දේශීය සිරිත් විරිත් පිළිපැදීමේ සහ ආර්ය සිංහල නම් භාවිත කිරීමේ අගය පහද දුන්නේ ය.

එතුමාගේ දේශනවලින් සිංහලයන්ගේ නිවට ගති සහ උදාසීනකම් දැඩි දෝෂ දර්ශනයට ලක් විය. පරගැති සිරිත් හිස්මුදුනින් පිළිගත් මුදලි මුහන්දිරම්වරුන්ට පවා දැඩි ලෙස දෝෂාරෝපණය කළේ ඔවුන් දේශීයත්වය අගයන පිරිසක් වනු දැකීමේ අරමුණ ඇතිව ය.



බුද්ධගයාව

1890 දී දඹදිව වන්දනාවට ගිය අනගාරික ධර්මපාලතුමා, බුද්ධගයාව හින්දු ආගමික සිද්ධස්ථානයක් ලෙස පවත්වා ගෙන යනු දැක මහත් කම්පාවට පත් විය. "සිංහලයිනි නැගිටිව්, බුද්ධගයාව බේරාගනිව්" යන උද්යෝග පාඨය යටතේ නව වැඩ පිළිවෙළක් ආරම්භ කළේ එතැන් සිට ය. ඒ සඳහා 1891 මහාබෝධි සමාගම පිහිටුවා 'බුඩිස්ට්' නම් සඟරාව ද ආරම්භ කළේ ය. පසු කාලයේ 'මහාබෝධි' නමින් පළ වූයේ එම සඟරාව යි.

බුද්ධගයාව බේරාගැනීමේ දැහැමි අරගලය සටන් පාඨ හෝ උද්ඝෝෂණවලට පමණක් සීමා නො කළ ධර්මපාල තුමා නීති මාර්ගයට ද බැස්සේ ය. අවසානයේ එතුමා ජයග්‍රහණය කළේ ය. බුද්ධගයාවේ බෞද්ධ අයිතිය නීතියෙන් ද තහවුරු විය. 1896 දී වෙසක් උත්සවයක් ද බුද්ධගයාවේ පවත්වන ලදි.

එය ධර්මපාලතුමාගේ පමණක් නොව සකල ලෝකවාසී බෞද්ධයන්ගේ ම ජයග්‍රහණයකි. අද අප දඹදිව චාරිකාවේ යෙදෙමින් බුද්ධගයාව ඇතුළු බෞද්ධ සිද්ධස්ථාන වැඳපුදා ගන්නේ එම ඓතිහාසික ජයග්‍රහණය නිසා ය. එය ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා ගේ ශාසනික මෙහෙවරෙහි උදාර ප්‍රතිඵලයකි. එතුමාට ඒ සඳහා බුරුමය ඇතුළු විවිධ රටවල බෞද්ධයන්ගේ සහාය ලැබිණි. විශේෂයෙන් හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා, රුසියානු ජාතික සමාජ සේවිකාවක වූ **බ්ලැවට්ස්කි** මැතිණිය, හොනලුලු දූපතේ ධනපතිනියක වූ ෆෝස්ටර් මැතිණිය සහ එතුමාගේ මවුපියන් කළ ආධාර උපකාර පිළිබඳ ව ධර්මපාලතුමන් සඳහන් කර ඇත.

අද දක්වා ම පළ කැරෙන සිංහල බෞද්ධයා පත්‍රය 1906 දී ආරම්භ කරන ලද්දේ ද අනගාරික ධර්මපාල තුමන් විසිනි. යටපත් කර තිබුණු සිංහල බෞද්ධ හඬ යළිත් මතු කරගැනීමට ක්‍රියාත්මක වූයේ එම පුවත්පත යි. එ කල ක්‍රියාත්මක වුණු අමද්‍යප ව්‍යාපාරය ද විදේශීය ආධිපත්‍යයෙන් අප රට මුදා ගැනීමේ සටනේ ම එක් කොටසක් විය. අනගාරික ධර්මපාල තුමා එම ව්‍යාපාරයෙහි ප්‍රධානියකු වූ අතර, ගව මස් කෑමට විරුද්ධ වැඩ සටහන් ද ක්‍රියාත්මක කළේ ය. ගවමස් කන්නන් සහ රා බොන්නන් වසලයන් ලෙස සැලකිය යුතු ය යි එතුමා පැවසී ය. එතුමා ගමන් කළ රථයේ, නියෝගයක ස්වරූපයෙන් " ගවමස් නොකනු" යන්න ප්‍රදර්ශනය කෙරිණි.

ජනතාව උනන්දු කරවා දේශීය කර්මාන්ත නඟා සිටුවීමට ක්‍රියා කළ අයකු වශයෙන් ද ධර්මපාල තුමාගේ සේවය අගය කළ හැකි ය. **"පරාධීන භාවයෙන් මිදීමට නම් අපේ ජාතික අවශ්‍යතාවන් අප රට තුළින් ම සපුරාගත යුතු ය."** යන්න එතුමා ගේ අදහස විය. එයින් පැහැදිලිවන්නේ "සමෘද්ධිය යනු ආර්ථික සහ ආධ්‍යාත්මික යන අංශ දෙකේ ම දියුණුව ය." යන බෞද්ධ සංකල්පයෙහි පිහිටා ධර්මපාලතුමන් ක්‍රියා කළ බව යි. දේශීයත්වය, ජාතිකත්වය, බෞද්ධකම ගැන ධර්මපාලතුමන් දේශනයෙන් සහ ලේඛනයෙන් අදහස් පළ කළේ අන්තර් වාර්ගික හෝ අන්තර් ආගමික ගැටුම් ඇති කිරීමට නො වේ. දේශ වාත්සල්‍යය, ජාති මාමකත්වය සහ බෞද්ධාගමික ලැදියාව ඇති කර, පරගැති මානසිකත්වයෙන් සිංහල බෞද්ධ ජනතාව මුදා ගැනීම පිණිස ය. එහෙත් ඇතැම් වාර්ගික අර්බුදවල දී ඒවාට එතුමා ද සම්බන්ධයැයි සැක කර අත් අඩංගුවට ගැනුණු අවස්ථා ද විය. 1915 ලංකාවේ වාර්ගික අරගලයක් ඇති වන විට ධර්මපාල තුමන් සිටියේ ඉන්දියාවේ ය. එහෙත් එහි දී ඉංග්‍රීසි ආණ්ඩුව විසින් සිර භාරයට ගැනුණු එතුමාට වසර හතක් නිවාස අඩස්සියේ සිටීමට සිදු විය. ඒ කිසිවකින් කම්පාවට පත් වී පසු බෑමට ලක් නොවූ එතුමා බරණැස මූලගන්ධකුටි විහාරයේ දී සිරි දේවමිත්ත ධර්මපාල නමින් පැවිදි බිමට පත් විය. ඒ 1931 වසරේ දී ය. 1932 දී උපසම්පදාව ලැබූ සිරිදේවමිත්ත ධර්මපාල හිමියෝ පසු ව රෝගී වීම නිසා 1933 අප්‍රේල් 29 දින අපවත් වූහ. "යළි යළිත් ඉපදී බුදුදහම ලෝකය පුරා ප්‍රචාරය කරන්නට ලැබේ වා" යන්න එතුමාගේ ප්‍රාර්ථනාව වූ බව සඳහන් වේ.

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා ජාතිකත්වය අගය කරමින් එය රැකගැනීමට අභීත ව සටන් කළ ජාතික වීරයෙකි. ලංකාවේ සහ භාරතයේ පමණක් නොව ලෝකයේ ම නිර්මල බුදුදහම පැතිරවීමට ධර්මදූත සේවාවෙහි යෙදුණු උතුම් බුද්ධශ්‍රාවකයෙකි. අමද්‍යප සටනේ පතාක යෝධයෙකි. බුද්ධගයාව අන්‍යාගමිකයන්ගෙන් බේරා ගැනීම පිණිස මෙහෙයවනු ලැබූ අහිංසක හා යුක්ති ගරුක සටනේ සෙන්පතියෙකි. මානසික වහල්භාවය නමැති අන්ධකාරයේ නිමග්න ව සිටි සිංහල බෞද්ධයන්ට ආලෝකය සැපයූ ප්‍රදීපස්තම්භයකි.

ගිහි දිනචරියාවක් සකස් කර ඉදිරිපත් කළ ධර්මපාලතුමා ළමයින්ට, වැඩිහිටියන්ට, ස්ත්‍රීන්ට දැන ගත යුතු කරුණු සිය ලිපි මඟින් ඉදිරිපත් කළේ ය. එම කරුණුවලින් සමහරක් එතුමාගේ ම වචනවලින් මෙසේ ය.

- ආර්ය ජාතික උතුම් ධර්මයක් සරණ යන සිංහලයන්ගෙන් පැවත එන අප සිංහල දරුවනි, පළමුකොට නුඹලා විසින් පවිත්‍රකම ඉගෙනගත යුතු යි. තමන් පරිභෝග කරන පාවිච්චි කරන ඇඳ පුටු වස්ත්‍රාභරණ සියල්ලක් ම පවිත්‍ර ව තබා ගත යුතු යි.

- සිංහලයන් දවසින් දවස පහළ යන්නේ බීමත්කම නිස යි. මත්පැන් බීම, අනුන්ට බොන්ට දීම, මත්පැන් නැනීම, විකිණීම බුදුරජාණන් වහන්සේ විසින් තහනම් කර තිබේ.

- ප්‍රාණඝාතය නොහොත් සතුන් මැරීම බුද්ධාගමේ තහනම් කර තිබේ. සතුන් මරන්ට එපා, මරවන්ට එපා, විකුණන්ට එපා, මරන්ට යන සත්‍යාට ජීවිත දානය දීපන්, මරණින් බේරපන්, සතුන් මරණවුන්ට අවවාද කර උන් අපායෙන් බේරා ගනින්.

- ගවමස් කන්ට එපා, ගවයා මරන්ට දෙන්ට එපා, ගවයන් මරන තැනකට යන්ට එපා, ගවමස් එල්ලා තිබෙන තැනකට යන්ට එපා, ගවයන් මරන තැනැත්තා චණ්ඩාල රොඩියෙකි.

- සිංහල බෞද්ධ දරුවනි, දිවි යතත් බොරුවක්, මුසාවාදයක් නොකියන්ට අධිෂ්ඨාන කර ගනින්.

- හාල්, මුං, කඩල, ධාල් පරදේශීන්ගෙන් ගන්නේ මන් ද? තමන්ගේ කෙත්වතු වවාගෙන තමන්ට ආහාරයට ඕනෑ කරන වී, හාල්, ලුණු, කහ, මිරිස් සියල්ලක් ම ලබාගැනීමට වීර්ය වැඩිය යුතු යි.

- මගේ රට, මගේ ජාතිය, මගේ ආගම, මගේ භාෂාව කියා වටිනා රත්න හතරක් මට තියෙනවා. ඒ රත්න හතර ආරක්ෂා කර ගැනීම මගේ යුතුකම යි.

- ප්‍රිය සිංහල බෞද්ධ සහෝදරයනි, තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේ සරණ යන නුඹලා උන් වහන්සේ මතක නැති කර දමා අන්‍ය ශාස්තෘන් අදහන ගුරුවරුන්ගේ ආදර්ශය ගැනීම බලවත් අනාදරයකි. සූර්යාලෝකය අත හැර කනමැදිරියන් පස්සේ යන්නේ මන් ද?

## සාරාංශය

ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා සිංහල බෞද්ධ ජනතාව තුළ ජාතික හා ශාසනික හැඟීම් පුබුදුවා නව ජීවයක් ගෙන දීමට ක්‍රියා කළ ගිහි බෞද්ධ ශ්‍රාවකයෙකි. විදේශිකයන් ගේ පාලනය යටතේ අහිමි වී තුබුණු සිංහල බෞද්ධ අයිතිවාසිකම් යළි ලබා ගැනීමට ජනතාව උනන්දු කර වූ ඕල්කට් තුමාට අනගාරික ධර්මපාල තුමා ද සහාය විය. එතුමා, දේශීය සිරිත් විරිත් පිළිපැදීමේ සහ ආර්ය සිංහල නම් භාවිත කිරීමේ අගය ජනතාවට පැහැදිලි කර දුන්නේ ය. පරාධීන භාවයෙන් මිදීමට නම් අපේ ජාතික අවශ්‍යතාවන් අප රට තුළින් ම සපුරා ගත යුතු ය යන්න එතුමා ගේ අදහස විය.

දේශීයත්වය, ජාතිකත්වය, බෞද්ධකම ගැන ධර්මපාල තුමන් අදහස් පළ කළේ, වාර්ගික ගැටුම් ඇති කිරීමට නොව දේශ වාත්සල්‍යය, ජාති මාමකත්වය සහ ශාසනික ලැදියාව ඇති කිරීමට ය. එතුමා අමද්‍යප සටනේ පතාක යෝධයෙකි. බුද්ධගයාව අන්‍යාගමිකයන්ගෙන් බේරා ගෙන ලෝකයේ ම බෞද්ධයන්ට යළිත් දායාද කරනු ලැබුයේ ධර්මපාල තුමන් විසිනි. ලෝකයේ විවිධ රටවල බුදු දහම පැතිර වීමට එතුමා ක්‍රියා කළේ ය. ඒ සඳහා දේශනය මෙන් ම ලේඛනය ද උපයෝගි කර ගත්තේ ය. ඩේවිඩ් හේවාවිතාරණ ධර්මපාල බවට පත් වූ අතර පසු ව අනගාරික ධර්මපාල බවටත් අවසාන කාලයේ පැවිදි ව සිරි දේවමිත්ත ධර්මපාල ස්වාමීන් වහන්සේ බවටත් පත් වූ එතුමා දඹදිව දී අපවත් විය.

## ක්‍රියාකාරකම්

01. අනගාරික ධර්මපාලතුමන් කළ ශාසනික සේවය නිදසුන් දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

02. ජාතික සිරිත් විරිත් අප අගය කළ යුත්තේ ඇයි දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

## පැවරුම

01. සිංහල බෞද්ධ සිරිත් සුරැකීමේ වැදගත්කම අරභයා ධර්මපාලතුමන් කළ දේශනයකට පුවත්පත් වාර්තාකරුවකු ලෙස ඔබ සහභාගි වූයේ යැයි සිතා එම දේශන වාර්තාව පිළියෙල කරන්න.

කටයුතු කිරීම ය<br>
නොකටයුතු නොකිරීම ය<br>
අණ පිළිපැදීම ය<br>
මෙතුන් ගුණ දියුණුවේ මගමය

සිරිත් මල්දම